# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,729 — 1959 අප්‍රේල් 24 වැනි සිකුරාද — 24.4.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැළපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 399 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 399 |


[සැලකිය යුතුයි. 1959 අප්‍රේල් 23 වෙනි දින පළවූ අංක 11,728 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ IV වැනි කොටස) පටන් ගන්නා පිටු අංකය 398 නොව 397 විය යුතුයි.]

## පළාත් පාලන නිවේදන

ඇල්. ජී.—බී (ජී්. 11/39/6).

### 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ, බදුලු දිස්ත්‍රික්කයේ බුත්තල වැදිරට ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

**යෝජනාව**

ප්‍රදේශ පාලන අමාත්‍ය වරයා විසින් සම්පාදනය කරන ලද්දා වූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව වර්ෂ 1953 ක් වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසැට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශිත පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 කේ සිට 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසැට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට බුත්තල වැදිරට ගම්කාර්ය සභාව විසින් වර්ෂ 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

වි. ගු. ම. ඇල්බට් සිල්වා,
සභාපති.

වර්ෂ 1959 ක්වූ ජනවාරි මස 23 වැනි දින,
මොණරාගල බුත්තල වැදිරට ගම්සභා කාර්යාලයේදීය.

399—ජේ. ඇන්. බි 13136—3,307 (4/59)

F I

## විවිධ දැන්වීම්

### බෝගොඩ ගම්කාර්ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව බෝගොඩ ගම්කාර්ය සභා සීමාව ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැණ විරුද්ධ වන්නේ අසවල් හේතුන් නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පළවන ද සිට දින දහ හතරක් ඇතුලත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) අංක 7 දරණ 1947 අංක 14 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. පී. ඇම්. පකීර් සයිබු ... | හාලිඇල මුස්ලිම් වීදියේ 156 දරණ ස්ථානය. |

සු. බ. ඒකනායක,
බෝගොඩ ගම්කාර්ය සභාවේ ප්‍රධානතුමා.

හාලිඇල, 17. 4. 59.

## විශේෂ නිවේදනයයි

1959 මැයි 1 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම සහ නිවේදන, 1959 අප්‍රේල් 27 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී